the Sri Lanka Gazette masthead:

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1623/11 - 2009 ඔක්තෝබර් 14 වැනි බදාදා - 2009.10.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.– බී. 2/2001.

1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනත

1999 අංක 35 දරන ශාක ආරක්ෂක පනතේ 12 වැනි වගන්තියේ (2) උපවගන්තිය යටතේ කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මෛත්‍රීපාල සිරිසේන,
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය.

2009 ඔක්තෝබර් මස 08 වැනි දින,
කොළඹ.
කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මෙම නියෝග "2009 අංක 01 දරන රෝග වැළැක්වීමේ, පාලනය කිරීමේ සහ මර්ධනය කිරීමේ (පොල් සහ වෙනත් තාල වර්ගයේ ශාක ) නියෝග" යනුවෙන් හඳුන්වනු ලබේ.

2. මෙම නියෝගවල උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන පරිපාලන දිස්ත්‍රික්ක තුළ පිහිටියා වූ ද, එම උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් වූ ද, ප්‍රදේශ මේ නියෝගවල කාර්ය සඳහා "රෝග බෝවී ඇති ප්‍රදේශ" වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන අතර එම ප්‍රදේශවල එකී උපලේඛනයේ III වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන රෝග වැළඳී ඇති ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබේ.

3. රෝග බෝවී ඇති යම් ප්‍රදේශයක් තුළ පිහිටි යම් ඉඩමක ඇති පොල් සහ වෙනත් තාල වර්ගයේ ශාක සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ වේ.

4. රෝග බෝවී ඇති හෝ නොමැති ප්‍රදේශවල ඇති පොල් සහ වෙනත් තාල වර්ගයේ ශාකවලට වැළඳී ඇති රෝග වැළැක්වීම, පාලනය කිරීම සහ මර්දනය කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ මේ පනත ප්‍රකාරව ඔහු විසින් පත් කරන ලද යම් බලයලත් නිලධරයකු විසින් අවශ්‍ය කඩිනම් පියවර ගැනීම සහ අවශ්‍ය විධාන හෝ මාර්ගෝපදේශ නිකුත් කිරීම කළ යුතුය.